# 17 අන් ජීවිත සුරැකීම

පෙම් කරන්න එකිනෙකාට  සුහද සොයුරු ප්‍රේමයෙන්
දිවි ගෙවන්න එකමුතු වී  සමිඳුන් තුළ සාමයෙන්

ඔබට වඩා අනුන් උතුම් කොට නිරතුරු සලකන්න
උඩඟු නොවී අසල්වැසියනට බුහුමන් දක්වන්න
අලස නොවී සිතට දිරිය ගෙන කටයුතු සපුරන්න
සමිඳු කෙරේ බැතිය පෙරටු කොට සේවය සලසන්න

පෙම් කරන්න එකිනෙකාට .............

සැපතේ හිඳී සිතෙන් උදම් නොව සතුටට පත්වන්න
විපතේ හිඳී නොපසුබටව තව ඉවසිලිමත් වන්න
උදය හවා දෙවිඳු යැදුම නම් අතපසු නොකරන්න
අසරණයන් පිහිට පතන විට පිළිසරණය වන්න

පෙම් කරන්න එකිනෙකාට .............

දුක් පීඩා කරන අය කෙරේ සාමය පතුරන්න
ඔබට පවා වරද කරන විට නපුරක් නොකරන්න
සතුටු සිනා රැලි නැගෙනා විට ඔබ ද සිනාසෙන්න
දුකට වැටී අනුන් පෙළන විට සැබවින් දුක්වන්න

පෙම් කරන්න එකිනෙකාට .............

(කිතුනු ගී 214)

ඉහත ගීතිකාව අවධානයෙන් ගායනා කර ඉන් ඔබට වැටහෙන කරුණු මෙනෙහි කරන්න.

## මිනිස් ජීවිතයට ගරු කිරීම

ආබෙල් බැටළු එඬේරෙක් විය.  කායින් ගොවියෙක් විය. කලක් ගත වූ පසු කායින් පොළොවෙන් නිපද වූ අස්වැන්න පඬුරක් වශයෙන් සමිඳාණන් වහන්සේට පූජා කළේ ය. ආබෙල් ද සිය බැටළු රැළේ කුළුදුල් පැටවුන්ගෙන් සමහරෙකු ද ඔවුන්ගේ හොඳ ම කොටස් ද ගෙන සමිඳාණන් වහන්සේට පූජා කළේ ය.  සමිඳාණන් වහන්සේ ද ආබෙල්



නොමිලේ බෙදාහැරීම සඳහා ය.

හා ඔහුගේ පඬුර සතුටින් පිළිගත් සේක. එහෙත්, උන්වහන්සේ කායින් සහ ඔහුගේ පඬුර නොපිළිගත් සේක. එබැවින් කායින් තදින් කිපී දුර්මුඛ විය.

සමිඳාණන් වහන්සේ ද කායින්ට කතා කොට, "නුඹ මෙතරම් කිපී, දුර්මුඛ වී සිටින්නේ මන්ද? නුඹ යහපත කරන්නෙහි නම් නුඹ පිළිගනු ලබන්නෙහි ය; නුඹ අයහපත කරන්නෙහි නම් පාපය රකුසෙකු සේ නුඹේ දොරකඩ ලැග සිටින්නේ ය. ඌ නුඹ මැඩලීමට බලාගෙන සිටියි. එහෙත් නුඹට ඌ දමනය කළ හැකි ය"යි වදාළ සේක.

ඉක්බිති කායින් සිය සොහොයුරු ආබෙල් අමතා, "අපි එළිමහනේ කෙතට යමු"යි කී ය. මෙසේ ඔවුන් ගිය විට කායින් සිය සොහොයුරු ආබෙල්ට විරුද්ධ ව නැගිට ඔහු මරා දැමී ය.

(උත්පත්ති 4:2-8)

ආබෙල් පිදූ පඬුර දෙවියන් වහන්සේට ප්‍රසන්න පඬුරක් විය. එය ප්‍රසන්න වීම හේතුවෙන් දෙවියන් වහන්සේ එම පඬුර පිළිගත් සේක. අප දෙවියන් වහන්සේට පුදන පඬුරු ද උන්වහන්සේට ප්‍රසන්න වීමට නම් හොඳ ම දෙය පූජා කළ යුතු ය. උදාහරණයක් ලෙස, අපේ හොඳ ම කාලය උන්වහන්සේට පූජා කරමින් දිනපතා අවදි වූ විගස යාච්ඤා කිරීමට අමතක නොකළ යුතු ය.

කායින් විසින් දෙවියන් වහන්සේට පුදන ලද පඬුර පිළිනොගැනීම නිසා, කායින් ආබෙල් කෙරෙහි ඊර්ෂ්‍යා සහගත හැඟීමකින් කටයුතු කළේ ය. ඊර්ෂ්‍යාව ඉතා සුළු දෙයක් ලෙස සැලකුවත් මෙම කතා පුවතේ දී එය ජීවිතයක් විනාශ කිරීම දක්වා වර්ධනය විය. කායින් විසින් ආබෙල් වන තම එක ම සහෝදරයා මැරී ය.

ඊර්ෂ්‍යාව මුල්අගුණ පාපයකි. එය මුල්අගුණ පාපයක් ලෙස සලකන්නේ බරපතළ පාපයක් කරා යොමු කරන නිසා ය. එම නිසා ඒවායින් අප වැළකිය යුතු ය. ඊර්ෂ්‍යාව පළිගැනීම කරා යොමු කළ බව කායින් සහ ආබෙල් කතාවෙන් දැක ගත හැකි වේ.


පළිගැනීමෙන් අන් ජීවිතවලට ගරු කිරීමට නොහැකි වේ. එම නිසා පළිගැනීම අප ජීවිත තුළින් අත්හළ යුත්තකි. පළිනොගෙන සැමට ප්‍රේම කළ යුතු බව ජේසුස් වහන්සේ අපට ඉගැන්වූ බව අප සිහිපත් කර එසේ කිරීමට උනන්දු වෙමු.

ඉහත ගීතිකාව අනුව ජීවත් වීමෙන් අන් ජීවිතවලට ගරු කළ හැකි ය.



නොමිලේ බෙදාහැරීම සඳහා ය.

## ගබ්සා කිරීම



17.1 රූපය - මව් කුසයේ සිටින දරුවෙකු


17.2 රූපය - මෙලොව එළිය දුටු මොහොතක දරුවෙකු

පින්තූර දෙස අවධානයෙන් බලන්න. තමන්ගේ මව දස මසක් කුසේ දරා ගෙන මොලොවට ඔබ බිහි කළ බව සිහිපත් කරන්න. එම නිසා ඔබේ මවට හා පියාට ස්තුති කරන්න. ඔබ මව් කුස පිළිසිඳ ගත් මොහොතේ සිට මේ දක්වා ආරක්ෂා කර රැක බලා ගත්තාටත් ස්තුති කරන්න.

ජීවිතය ආරම්භ වන්නේ මෙලොවට උපත ලැබීමෙන් පසු නොව පිළිසිඳ ගත් මොහොතේ ය. පිළිසිඳ ගත් මොහොතේ පටන් ජීවිතය දෙවියන් වහන්සේට අයිති බව පහත සඳහන් ශුද්ධ ලියවිලි පාඨ මගින් පෙන්වා දෙයි.



නොමිලේ බෙදාහැරීම සඳහා ය.

මා නුඹ කුසෙහි පිළිසිඳ ගැනීම ඇති කරන්නටත් පෙර පටන් මම නුඹ හඳුනා ගතිමි. නුඹේ උපතටත් පෙර, මම නුඹ කැප කළෙමි.

(ජෙරමියා 1:5)

මාගේ ඇටකටු සෑදෙන විට, මවු කුසෙහි මා වැඩෙන විට, රහසිගත ව මා තැනෙන විට මා එහි වූ බව ඔබ දැන සිටි සේක.

(ගීතාවලිය 139:15)

මව් කුසයේ සිටින ජීවිතය පවා දෙවියන් වහන්සේට අයිති නම් එය විනාශ කිරීමට අපට අයිතියක් නැත. එය සදාචාර විරෝධී ක්‍රියාවකි. කායින් විසින් කළ පාපය ම ගබ්සා කරන්නා විසින් කරනු ලබයි. ඔහු ආබෙල්ටත් වඩා අහිංසක හා අසරණ (ළදරුවකු) පුද්ගලයකු මරා දමයි. ආත්ම ආරක්ෂාව වෙනුවෙන් කටයුතු කළ නොහැකි කෙනෙකු මරා දමයි. මේ පිළිබඳ ව කතෝලික සභා ධර්මෝපදේශය මෙසේ පවසයි.

ගබ්සාව ළදරු ඝාතනයකි. අශික්ෂිත අපරාධයකි.

(ක.ස.ධ. 2271)

## ජීවිත විනාශ නොකිරීම

ගබ්සා නොකළ යුතුවා මෙන් ම කිසි ම ජීවිතයක් විනාශ නොකළ යුතු බව ද ශුද්ධ වූ සභා මාතාව අපට මෙසේ උගන්වන්නී ය.

පස්වන පනතෙන් තහනම් වන කරුණු ශුද්ධ වූ ලියවිල්ල පැහැදිලි කරයි. "අහිංසකයන් හා ධර්මිෂ්ඨයන් ඝාතනය නොකරන්න" සිතාමතා ම අහිංසක පුද්ගලයකු ඝාතනය කිරීම, මානව උදාරත්වයට ද මැවුම්කරුවාණන්ගේ උත්තරීතර බවට හා ස්වර්ණමය වූ නීතියට ද බරපතළ ලෙස එරෙහි වන්නේ ය. මෙම තහනම් නිතීය විශ්වීය ලෙස වලංගු වේ. එය එකිනෙකාට මෙන් සැම දෙනාට ද සැම කල්හි ම, සැම තැන්හි ද පවත්නා වූ නියමයකි.

(ක.ස.ධ. 2261)

අභිසංකයන් පමණක් නොව වරදකරුවන් පවා ඝාතනය නොකළ යුතු බව කායින්ට දෙවියන් වහන්සේ පැවසූ පහත සඳහන් වචනවලින් ද පැහැදිලි වේ.

> "යම් කෙනෙක් කායින් මැරුවොත් ඔහුගෙන් එමෙන් සත් වරක් දරුණු ලෙස පළිගනු ලබන්නේ ය"යි වදාළ සේක. එබැවින් සමිඳුණන් වහන්සේ ද යමෙකුට කායින් මුණ ගැසුණොත් කායින් නොමරන පිණිස ඔහු පිට ලකුණක් තැබූ සේක.
>
> (උත්පත්ති 4:15)

ජේසුස් වහන්සේ කන්ද උඩ දේශනයේ දී ද පස්වන පනත සිහි ගන්වයි.

> මිනී නොමරන්න; මිනී, මරන කවරෙකු වුව ද විනිශ්චයට යටත් වනු ඇතැයි පැරැන්නන්ට කී බව ඔබ අසා ඇත. එහෙත් මම ඔබට කියමි; තමාගේ සහෝදරයා සමග කෝප වන කවරෙකු වුව ද ඔහු අධිකරණයට යටත් වනු ඇත. තමාගේ සහෝදරයාට මෝඩයා කියා ගරහන කවරෙකු වුව ද ඔහු ශ්‍රේෂ්ඨාධිකරණයට යටත් වනු ඇත. "ජඩයා" කියා ගරහන කවරෙකු වුව ද ඔහු නිරා ගින්නට ගොදුරු වනු ඇත.
>
> (මතෙව් 5:21-22)

තමාගේ සහෝදරයා සමග සාමයෙන් ජීවත්විය යුතු බව ජේසුස් වහන්සේ අපට පෙන්වා දෙයි. මෙමගින් අන් අයගේ ජීවිත සුරැකීමට අප සැම බැඳී සිටින බව පෙන්වයි.

කෝපය, ක්‍රෝධය, පළිගැනීම ආදිය ද සහෝදර ප්‍රේමයට විරුද්ධ වේ. පළිනොගත යුතු බව අනෙක් කම්මුල හැරවීමට අවවාද කිරීමෙන් තම ශ්‍රාවකයන්ට ජේසුස් වහන්සේ උගන්වා වදාළ සේක.

දේව දරුවන් හැටියට අපගේ පැවැත්ම ශ්‍රේෂ්ඨ විය යුතු ය. අපි උතුම් දේව පියෙකුගේ දරුවන් හැටියට සහෝදර සහෝදරියන්ට ප්‍රේම කළ යුතු වෙමු. අසල්වැසි ප්‍රේමය අපගේ විශේෂ ලක්ෂණයක් විය යුතු ය. එමගින් අන් අයගේ ජීවිත සුරැකිය යුතු වෙමු. සැම කෙනෙක් ම දෙවියන් වහන්සේගේ සමානකමට මවා ඇති නිසා අපි සැවො ම දේව දරුවෝ වෙමු.



නොමිලේ බෙදාහැරීම සඳහා ය.

**ක්‍රියාකාරකම**



1. අන් අයගේ ජීවිත සුරැකීමට ඔබට කළ හැකි දේවල් **තුනක්** ලියන්න.
2. "ගබ්සාව" පාපයක් වන්නේ කෙසේ දැයි පැහැදිලි කරන්න.



**ජීවිතයට බිඳක්**

***සෑම මනුෂ්‍යයෙකු ම දේව මැවිල්ලක් නිසා අපගේ ජීවිත මෙන් ම අන් අයගේ ජීවිත ආරක්ෂා කිරීමට අපි කැපවෙමු.***



නොමිලේ බෙදාහැරීම සඳහා ය.